# පහතරට තෙත් කලාපිය ප්‍රාග් ඓතිහාසික ගල්ලෙන් ආශ්‍රිත හමුවන සත්ත්ව අවශේෂ පිළිබඳ පුරාවිද්‍යාත්මක අධ්‍යනයක්

ඒ.එම්.එම්.අබේකෝන්*

දේශගුණික ලක්ෂණ වලට අනුව ශ්‍රී ලංකාව තෙත්, වියළි, අන්තර් මධ්‍යම ලෙස කලාප ත්‍රිත්වයකට බෙදා දක්වනු ලැබේ. ප්‍රාග් ඓතිහාසික අවධියට අයත් ජනාවාස ක්ෂේත්‍රයන් මෙම කලාප ත්‍රිත්වයෙහි අඩුවැඩිතා සහිත විසිරි පවතී. මෙම නිබන්ධනය යටතේ මූලික අධ්‍යයන ක්ෂේත්‍රය වශයෙන් පහතරට තෙත් කලාපය තුළ තිබෙන වූ ප්‍රාග් ඓතිහාසික ජනාවාස පිළිබඳව අවදානය යොමු කරනු ලබයි. මෙම අධ්‍යයනයේ අරමුණ වනුයේ පහතරට තෙත් කලාපයේ ප්‍රාග් ඓතිහාසික ගුහා ක්ෂේත්‍රයන් හී හමුවන සත්ත්ව අවශේෂ සම්බන්ධයෙන් ඉතා ගැඹුරු අවබෝධයක් ලබාගැනීමය. එමෙන්ම ප්‍රාග් ඓතිහාසික කැණීම් මගින් හමු වූ සත්ත්ව අවශේෂයන් තුළින් ප්‍රාග් මානවයාගේ ජීවන රටාවට කොතරම් බලපෑවේ ද යන්න විමර්ශනය ද මෙහි තවත් අරමුණකි. මෙම අරමුණු සාර්ථක කර ගැනීම සඳහා මෙතෙක් සිදුකර ඇති ප්‍රාග් ඓතිහාසික හා සත්ත්ව පුරාවිද්‍යාත්මක පර්යේෂණයන්හි වාර්තා සහ ද්‍රව්‍යාත්මක සාධක අධ්‍යයනය කිරීම මෙහි මූලික පර්යේෂණ ක්‍රමවේදය වේ.

ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික ගුහා කැණීම් තුළින් හමුවන අවශේෂ අතරින් සත්ත්ව අවශේෂ සුවිශේෂී ස්ථානයක් ගනු ලබයි. ප්‍රාග් මානවයාගේ ජීවන ක්‍රමය ලෙස හඳුන්වනු ලබන්නේ දඩයම් දිවි පෙවෙතයි. ඔවුන්ගේ සටන බොහෝදුරට පවත්වන්ට ඇත්තේ මාධ්‍ය ප්‍රමාණයේ හා කුඩා ප්‍රමාණයේ සතුන් සමග විය හැකි බව එම සත්ත්ව අවශේෂ මගින් ගම්‍ය වේ. එහි දී ආහාරයට ගනු ලැබූ සතුන් අතර ඉත්තෑවා, දඬුලේනා, වඳුරා, හම්බාවා, කබල්ලෑවා, මීමින්නා, තිත්මුවා, වළිකුකුළා, ලුලා , ඉබි වර්ග ආදී සතුන් පෙන්වාදිය හැක. කොටි, අලි වැනි විශාල සතුන්ගේ අවශේෂ ද හමුවේ. මෙම සතුන් ආහාරය සඳහා හෝ කුතුහල මෙන්ම අලංකාරය නිසාවෙන් රැගෙන ලඟ තබා ගත්ත ද යන්න තවමත් ගැටළු සහගත වේ. මෙම සත්ත්වයන් ආහාරයට පමණක් නොව එම අස්ථීන් මගින් ආයුධ නිෂ්පාදනය සඳහා ද, ආභරණ නිෂ්පාදනය සඳහා ද යොදා ගෙන ඇති බවට සාධක වේ. එමෙන්ම මෙම අස්ථි අවශේෂයන් මගින් සත්ත්ව ගෘහාශ්‍රිතකරණය, අභිචාර ක්‍රම, පරිසරය සමග තිබෙන්නා වූ අන්තර් සම්බදතාව හා කාලනිර්ණය වැනි කරුණු පිළිබඳව මනාව අවබෝධයක් ලබාගත හැකිවේ.

ප්‍රමුඛ පද : ප්‍රාග් ඓතිහාසික, තෙත් කලාපයේ, සත්ත්ව අවශේෂ

* පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය